# දහම් පාසලේ 16 වැනි සංවත්සර උත්සවය වෙනුවෙන් 1 වසර දරුවන් ගයනා කරන ගීතය

## පාන්දරින් ඉස්කෝලෙට ටැන්ටු කරත්තෙන් — Pandarin isskoleta tantu karaththen

| | |
|---|---|
| පාන්දරින් ඉස්කෝලෙට ටැන්ටු කරත්තෙන් | Pandarin isskoleta tantu karaththen |
| තොප්පි ගොනා ඉස්සරහින් මං පිටිපස්සෙන් | Thoppi gona issarahin man pitipassen |
| හනි හනිකට උඹ යනකොට | Hani hanikata umba yanakota |
| හනි හනිකට උඹ යනකොට | Hani hanikata umba yanakota |
| පාර කියන්නෑ තෝනෙන් | Para kiyanne thonen |
| පාර කියන්නෑ කෙවිටෙන් | Para kiyanne kewiten |
| | |
| පුංචි කාලේ උඹට බොන්න | Punchi kale umbata bonna |
| එරිච්ච කිරි බිව්වලු මං | Erichcha kiri biwwalu man |
| වත්ත පහළ උඹේ පිනුම් | Waththa pahala umbe pinum |
| දැක්කම හිනැහුනාලු මං | Dakkama hinehunalu man |
| ලාඩම් නැති උඹෙ පා කුර | Ladam nathi umbe pa kura |
| ගල් කන්දෙදි රිදෙන තරන් | Gal kandedi ridena tharan |
| උඹේ කඳුළු මට කියද්දි | Umbe kandulu mata kiyaddi |
| උඹට හොරෙන් අඬනව මං | Umbata horen andanawa man |
| පාර කියන්නෑ තෝනෙන් | Para kiyanne thonen |
| පාර කියන්නෑ කෙවිටෙන් | Para kiyanne kewiten |
| | |
| ඉස්කෝලෙන් ශිල්ප අරන් | Iskolen shilpa aran |
| මං ලොකු මිනිහෙක් වෙන්නම් | Man loku minihek wennam |
| බිව්ව කිරට ඇද්ද බරට | Biwwa kirata adda barata |
| කළගුණ මං සලකන්නම් | Kalaguna man salakannam |
| බැරි බර දෙන මේ වියකර | Bari bara dena me wiyakara |
| උඹේ කරෙන් ගලවන්නම් | Umbe Karen galawannam |
| උජාරුවට දුව පනින්න | Ujaruwata duwa paninna |
| ගෙජ්ජි වැලක් පළඳන්නම් | Gejji welak paladannam |
| පාර කියන්නෑ තෝනෙන් | Para kiyanne thonen |
| පාර කියන්නෑ කෙවිටෙන් | Para kiyanne kewiten |
| | |
| පාන්දරින් ඉස්කෝලෙට ටැන්ටු කරත්තෙන් | Pandarin isskoleta tantu karaththen |
| තොප්පි ගොනා ඉස්සරහින් මං පිටිපස්සෙන් | Thoppi gona issarahin man pitipassen |
| හනි හනිකට උඹ යනකොට | Hani hanikata umba yanakota |
| හනි හනිකට උඹ යනකොට | Hani hanikata umba yanakota |
| | |
| පාර කියන්නෑ තෝනෙන් | Para kiyanne thonen |
| පාර කියන්නෑ කෙවිටෙන් /// | Para kiyanne kewiten /// |